**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2018**

-----------------------------------------------------------------------------------------------------

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ප්‍රථම ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එලඹි අංක.9186-එස් ආර්අයි(ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය හා මේ සමඟ වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2016 දෙසැම්බර් 19 දින එළැඹි ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුර පලාතේ කුඩා හුදෙකලා දූපත් හා නයනතිව්, අනලතිව් හා ඩෙල්ෆ් දූපත් තුල වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා එලදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන අතර එම මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු පිරිවැයෙන් රු.මිලියන 180.72 කට සමාන එජඩො මිලියන 1.26 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබූ අතර රු.මිලියන 106.56 සමාන එජඩො මිලියන 0.74 ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශයන් මඟින් මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකවරුන්ගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඔඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා සැලසුම් අමාත්‍යාංශය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාල ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින හෝ එදිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත වන අතර එය ඉදිරිපත් කිරීම සිදුකර තිබුනේ 2019 ජූනි 06 දින විය. | අරමුදල් ප්‍රතිපූර්ණය කරගැනීම ප්‍රමාදවීමේ හැකියාවන් | අදහස් දක්වා නොමැත | චක්‍රලේක උපදෙස්වලට අනුකූල වීමේ අවශ්‍යතාවය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘති ක්‍රියාකාරකම් මුහුදු ජලය ප්‍රතිආශ්‍රුත පිරියතක් සැපයීම හා සවිකිරීම සමඟ වූ සිවිල් වැඩ කාර්යයන් සහ අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් හා ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම යනුවෙන් සංරචක 2 කින් සමන්විත විය. එයින් 2018 ඔක්තෝම්බර් 15 දින මුහුදු වතුර ප්‍රතිආශ්‍රුත පිරියතක් සැපයීම හා සවිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පමණක් ප්‍රදානය කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 ජූනි 07 දින එළඹුනු උපදේශක සේවා කොන්ත්‍රාත්තුවේ යොමු කොන්දේසි ප්‍රකාරව නයනතිව් දූපතේ කුඩා ප්‍රමාණයේ මුහුදු ජලය පිරිපහදු කිරීමේ පිරිතයෙහි පිරිවිතර හා ලංසු ලේඛණ සැලසුම් කිරීම හා කෙටුම්පත් කිරීමට අදාලව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහය වීම උපදේශකගේ වගකීමක් වේ. කෙසේ වුවද, උපදේශක සේවා කොන්ත්‍රාත් ගිවිසුමේ දිනය වූ 2018 ජූනි 07 දිනට පෙර 2018 මාර්තු 28 දින මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත සඳහා වූ කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීම සිදු කර තිබුණි. | අදාල උපදේශකගේ අත්දැකීම් හුවමාරු කරගැනීමට හා වැඩ සම්බන්ධ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට අවස්ථාවක් නොවීම. | අදාල උපදේශකට ඔහුගේ අත්දැකීම් හුවමාරු කරගැනීමට අවස්ථාවක් නොවුනත්, පූර්ව ලංසු රැස්වීමේ සිට ඔහුගේ අත්දැකීම් ඉදිරිපත් කරන ලදී. | උපදේශකගේ දැනුම හා අත්දැකීම් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා හුවමාරු කර ගැනීමට පියවර ගත යුතුවේ. |